ප්‍රංශයෙහි සිදු වූ පුද්ගලයින් පස් දෙනෙකු ඝාතනය කිරීමේ සිදුවීමක්, මාධ්‍ය ඔස්සේ වාර්තා කර තිබූ අයුරු අපගේ නිරීක්ෂණයට ලක් විණි.

මේ සම්බන්ධයෙන් වූ සිළුමිණ ලිපිය තුළ දැක්වුණේ අපරාධකරු සහ එම පවුල ශ්‍රී ලාංකික දෙමළ සම්භවයක් ඇති අයවලුන් බවයි. කෙසේ වෙතත් ඉරිදා ලංකාදීප සහ මේ පිළිබඳව වාර්තා කළ අපගේ නිරීක්ෂණයට ලක් වූ වෙනත් මාධ්‍ය මගින්, අදාල අයවලුන් ලාංකික සම්භවයක් සහිත අය ලෙසින් විනා ඔවුන්ගේ වාර්ගිකත්වය විශේෂයෙන් සඳහන් කර නොතිබුණි.

පුවතකට සෘජුවම අදාල නොවන්නේ නම්, අයෙකුගේ වාර්ගිකත්වය පුවත තුළ සඳහන් නොකළ යුතු බව ශ්‍රී ලංකා කර්තෘ සංසදය මගින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශනයන්හි දැක්වේ.

මෙසේ ගත් විට සිළුමිණ පුවත තුළ සිදුවීමට අදාල අයගේ වාර්ගිකත්වය විශේෂයෙන් සඳහන් කිරීම අවශ්‍ය වේද? එය මාධ්‍ය ආචාර ධාර්මික උල්ලංඝනයක් නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayLankadeepa #Silumina**